Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
Second Term Test - Grade 08 - 2024

විද්‍යාව

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

I පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය අමුද්‍රව්‍යයක් වන්නේ කුමක්ද?
1) ඔක්සිජන් වායුව
2) ජලය
3) හරිතප්‍රද (ක්ලෝරොෆිල්)
4) ආලෝක ශක්තිය

2. උත්ස්වේදනය වැළැක්වීමට ශාක පත්‍ර වල ඇති අනුවර්තනයක් **නොවන්නේ,**
1) ඝනකම් ඉටි උච්චර්මයක් පිහිටීම.
2) පත්‍ර තලය විශාලව පිහිටීම.
3) පත්‍ර සිහින් වීම.
4) පත්‍ර කටු බවට පත් විකරණය.

3. පහත මූලද්‍රව්‍ය අතරින්, ලෝහ පමණක් අඩංගු පිළිතුර කුමක්ද?
1) සින්ක්, ගෝල්ඩ්, අයඩින්, ඇලුමිනියම්
2) කාබන්, සල්ෆර්, අයන්, සෝඩියම්
3) සෝඩියම්, කොපර්, සින්ක්, අයන්
4) සින්ක්, අයන්, රසදිය, කාබන්

4. පහත සඳහන් ඉන්ධන අතරින් ඝන ඉන්ධනයක් වන්නේ,
1) ද්‍රවීකෘත පෙට්‍රෝලියම්
2) ඉටි
3) ඩීසල්
4) භූමි තෙල්

5. තන්‍ය බව දැකගත හැකි ද්‍රව්‍ය කුමක්ද ?
1) වීදුරු
2) මිනිරන්
3) රෙදි
4) කොපර්

6. නිල් තීන්ත පීරිසියක තබන ලද සුදු හුණු කූරක නිරීක්ෂණ පදනම් කොට එළඹිය හැකි නිගමනය කුමක්ද ?
1) හුණු කූර නිල් පැහැ වීම
2) හුණු කූර තෙත් වීම
3) ඝන පදාර්ථයේ අසංතතික බව
4) හුණු කූර සුදු පැහැ අඩු වී රතු වීම

7. අවස්ථා විපර්යාසයක් වන්නේ පහත කුමන අවස්ථාවේද ?
1) Mg පටියක් දහනය
2) $CuSO_4$ ද්‍රාවණයකට යකඩ ඇණයක් දැමීම.
3) ද්‍රව ඉටි සිසිල් කිරීම
4) තනුක HCl අම්ලයට Mg පටියක් දැමීම

8. පානීය ජලය සහ කරදිය ඝනත්ව කුප්පියකට සම්පූර්ණයෙන් පුරවා වෙන වෙනම ස්කන්ධය මැන ගත් විට නිරීක්ෂණය වන්නේ, කරදිය පුරවා ඇති විට වැඩි ස්කන්ධයක් ඇති බවය. මෙයින් ගත හැකි නිගමනය වන්නේ
1) පානීය ජලයට වඩා කරදියේ ඝනත්වය වැඩි බවය.
2) කරදියට වඩා පානීය ජලයේ ඝනත්වය වැඩි බවය.
3) පානීය ජලය සහ කරදියේ ඝනත්වය සමාන බවය.
4) පානීය ජලය සහ කරදිය මිශ්‍රවන බවය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

9. කට කුඩා හා කට විශාල කෝප්ප දෙකක් X හා Y ලෙස නම් කර සමාන ආතති ඇතිවන පරිදි රබර් පටලයක් සවිකර එක සමාන බලයකින් කම්පනය කල විට,

1) X හි හඬේ සංඛ්‍යාතය Y ට වඩා වැඩිය

2) X හි හඬේ සංඛ්‍යාතය Y ට වඩා අඩුය

3) X හා Y හි සංඛ්‍යාතය සමානය

4) නිශ්චිතව කිව නොහැක

10. ආලෝක අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කළ නොහැකි ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය වන්නේ

1) බැක්ටීරියා 2) දිලීර 3) වෛරස 4) ප්‍රොටෝසෝවා

11. යකඩ මල බැඳීම සඳහා අවශ්‍ය වන සාධක වන්නේ,

1) කාබන්ඩයොක්සයිඩ් වායුව, කාබන් මොනොක්සයිඩ් වායුව

2) කාබන්ඩයොක්සයිඩ් වායුව, ජල වාෂ්ප

3) ඔක්සිජන් වායුව, හයිඩ්‍රජන් වායුව

4) ඔක්සිජන් වායුව, ජලය

12. මිනිසාගේ ශ්‍රව්‍යතා පරාසය වන්නේ,

1) 20 Hz - 2000 Hz 3) 20 Hz - 20 kHz

2) 200 Hz - 200000 Hz 4) 200 Hz - 2000 Hz

13. යම් වස්තුවක් තත්පර 5 කට කම්පන 500 ක් ඇති කරයි නම් එහි සංඛ්‍යාතය වන්නේ,

1) 500 Hz 3) 50 Hz

2) 100 Hz 4) 5000 Hz

14. සංශුද්ධ ජලයේ ද්‍රවාංකය හා තාපාංකය පිළිවෙලින් දක්වා ඇත්තේ,

1) 10 ^{0}C හා 100 ^{0}C වේ 3) 1 ^{0}C හා 100 ^{0}C වේ

2) 10 ^{0}C හා 1000 ^{0}C වේ 4) 0 ^{0}C හා 100 ^{0}C වේ

15. ගිනි ත්‍රිකෝණයේ සඳහන් සාධක වන්නේ,

1) තාපය, ඉන්ධන, ජලය 3) තාපය, ඔක්සිජන්, ජලය

2) තාපය, ඉන්ධන, ඔක්සිජන් 4) ඔක්සිජන්, ජලය, තාපය

16. සල්ෆර් මූලද්‍රව්‍ය අඩංගු සංයෝගයකි,

1) ගෙන්දගම් 3) හුණුගල්

2) ලුණු 4) ග්ලූකෝස්

17. නයිට්‍රජන් වායුව සිලින්ඩර් තුළ ගබඩා කිරීමේ දී භාවිත කර ඇති භෞතික ගුණයකි,

1) ප්‍රසාරණය වීමේ හැකියාව 3) ඝනත්වය අඩු වීම.

2) සැහැල්ලු වීම. 4) සම්පීඩ්‍යතාව

18. ඌර්ධවපාතනය සිදුවන අවස්ථාවක් සඳහා උදාහරණයකි.

1) ද්‍රව ඉටි ඝන වීම. 3) හුමාලය ද්‍රව ජලය වීම.

2) අයඩින් වාෂ්ප වීම. 4) ඝන ඉටි ද්‍රව වීම.

19. විචල්‍ය ප්‍රතිරෝධක පරිපථ සංකේතය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

1) 2) 3) 4)

20. පහත පරිපථයේ A සහ B අතරට කුමන ද්‍රව්‍ය තැබූ විට බල්බ දැල්වේද?



1) පැන්සල් කූර

2) මයිකා පතුර

3) PVC කැබැල්ල

4) නයිලෝන් කැබැල්ල

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ද ඇතුලුව තවත් ප්‍රශ්න 4ක් සඳහා පිළිතුරු සපයන්න. (මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5 ක් සඳහා පිළිතුරු සපයන්න)**
- **පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් ද ඉතිරි ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ලැබේ.**

1. A මිනිස් දේහය විවිධ සෛල වර්ග පටක ඉන්ද්‍රියන් හා පද්ධති එක් වීමෙන් ගොඩනැගී ඇති අතර ආහාර ජීර්ණය, ස්වසනය හා ද්‍රව්‍ය පරිවහනය හා ජීවී ක්‍රියාවලි සිදු කිරීම සඳහා සංවිධානය වී ඇත.



1 රූපය



2 රූපය

I. 1 හා 2 රූප වලින් පෙන්නුම් කෙරෙන පද්ධති හඳුන්වන්න? (ලකුණු 2)

II. එම පද්ධති වලින් ඉටු කෙරෙන ජීවී ක්‍රියාවලි නම් කරන්න (ලකුණු 2)

III. පහත අවයව සඳහා ගැළපෙන අක්ෂර ඉහත රූප සටහන් දෙකෙන් තෝරා ලියන්න (ලකුණු 1/2 x 4 = 2)

අවයව	අක්ෂර
වෘක්ක	
මස්තිෂ්කය	
සුෂුම්නාව	
මුත්‍රාශය	

IV. පර්යන්ත ස්නායු පද්ධතිය නිර්මාණය වන ආකාරය දෙවෙනි රූප සටහන ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 2)

V. සිසුවෙක් දෛනික ජීවිතයේදී තමන් විසින් අනුගමනය කරන යහපත් සෞඛ්‍ය පුරුදු පහත ලෙස පෙළ ගස්වා ඇත.

a) නිවැරැදි වේලාවට ආහාර ගැනීම
b) දිනපතා ප්‍රමාණවත් පරිදි පිරිසිදු ජලය පානය කිරීම
c) අධික ලෙස නිදි වැරීමෙන් වැළකීම
d) අධික ලවණය හා ඇඹුල් සහිත ආහාර භාවිතය සීමා කිරීම

1 රූපයෙන් දැක්වෙන පද්ධතියේ යහ පැවැත්ම සඳහා වඩාත් සුදුසු සෞඛ්‍ය පුරුදු දෙකකට ගැළැපෙන අක්ෂර ලියන්න (ලකුණු 2)

VI. හදිසි අනතුරකට ලක් වූ පුද්ගලයෙකු කශේරුවට හානියක් නොවන ආකාරයට රෝහල් ගත කිරීමේ දී අනුගමනය කළ යුතු පියවරක් ලියන්න (ලකුණු 1)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

1. B



3 රූපය

I. 3 රූප සටහනේ හී නම් කර ඇති පදාර්ථ භෞතික ස්වාභාවය අනුව වර්ග කරන්න. (3 ම නිවැරදි නම් ලකුණු 1)

II. මෙම ක්‍රියාකාරකමේ ලද හැකි නිරීක්ෂණ දෙකක් ලියන්න (ලකුණු 2)

III. ඉහත ක්‍රියාකාරකමෙන් ලද නිරීක්ෂණ ඇසුරෙන් සන පදාර්ථයේ අංශුමය ස්වාභාවය පිළිබඳ ඔබ එළෙඹෙන නිගමනය කුමක්ද? (ලකුණු 2)

2. A පහත දී ඇත්තේ විවිධ කාණ්ඩ වලට අයත් ජීවීන් කීප දෙනෙකුගේ රූප සටහන්ය. එම රූප සටහන් හොඳින් නිරීක්ෂණය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



I. ඉහත ජීවීන් පෘෂ්ඨ වංශීන් හා අපෘෂ්ඨ වංශීන් ලෙස වර්ග කරන්න. (අක්ෂර පමණක් සෑහේ) (ලකුණු 2)

II. පහත දැක්වෙන සත්ත්ව කාණ්ඩ වලට ගැළපෙන ජීවීන් සඳහා අදාළ අක්ෂර ලියන්න.

a. මැමේලියා
b. මොලුස්කා
c. ඇනලීඩා
d. ඇම්බියා

III. ජලයේ ජීවත් වන ක්ෂීරපායී සත්වයෙකු නම් කරන්න (ලකුණු 1)

IV. සත්ව ලෝකයේ වැඩිපුරම ඇති සත්ව කාණ්ඩයේ නම ලියන්න (ලකුණු 1)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

2.B

I. තනි සෛලයකින් හෝ සෛල කිහිපයකින් ගොඩ නැගී ඇති පියැවි ඇසට පැහැදිලිව නොපෙනෙන ජීවීන් ක්ෂුද්‍ර ජීවීන් වේ. මොවුන්ගේ හිත කර මෙන්ම අහිතකර බලපෑම්ද ඇත.

A තීරුවේ දැක්වෙන රෝගයට අදාළ රෝග කාරක ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය B තීරුවෙන් තෝරන්න. (ලකුණු 1/2 × 4=2)

රෝගය	රෝග කාරකය
1. දද	a. වෛරස්
2. මැලේරියා	b. දිලීර
3. ඩෙංගු	c. බැක්ටීරියා
4. ක්ෂය රෝගය	d. ප්‍රොටෝසෝවා

II. ආහාර වර්ගය අනුව ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය වෙනස් වේ. ඒ අනුව (පැසීම, මුඩුවීම, පූතීභවනය) වශයෙනි. පහත ආහාර නරක් වීම හඳුන්වන විශේෂ නාම ඒවා ඉදිරියෙන් ලියන්න.

a) කැවුම්
b) මස්
c) දොදොල්
d) රට කජු
e) මාළු
f) කිරිබත්

(ලකුණු 1/2 × 6 = 3)

3. පරිසරයේ සුන්දරත්වය හා අපූර්වත්වයට ප්‍රධාන හේතුව ශාක හා සතුන් අතර පවතින විවිධත්වය යි. ශාක කොටස්වල විවිධත්වය අධ්‍යනය කිරීමේදී සිසුන් නිරීක්ෂණය කළ ශාක කිහිපයක් පහත දැක්වේ.



I. ඉහත රූප සටහන් වලට අදාළ අක්ෂර ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න (ලකුණු 1/2 × 4 = 2)

ශාක කොටසේ විශේෂත්වය	ශාකයට අදාල අක්ෂරය
ප්‍රචාරණ කඳක් ලෙස	
සංචිත මූලක් ලෙස	
ප්‍රභාසංස්ලේෂී කඳ ලෙස	
ව්‍යාජ කඳක් ඇති ශාකයකි	

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

II. A ශාකයේ සත්‍ය කඳෙන් ඉටු කෙරෙන ප්‍රධාන කෘත්‍යන් 2 ක් ලියන්න (ලකුණු 2)

III. (අ) පැත්තෙහි ඇති ශාක කොටස මගින් ඉටු කරන කෘත්‍යට සමාන කෘත්‍යක් ඉටු කරන ශාකයක් (ආ) පැත්තෙන් තෝරා ලියන්න (ලකුණු 1/2 x 6 = 3)

(අ)	(ආ)
A ගොටුකොළ කඳ	වැටකෙයියා ශාකය
B පතොක් කඳ	කංකුං
C කැරට් මුල	රාබු
D නුග මුල (කරු මුල්)	රත් කඩොල්
E කෙසෙල් කඳ (භූගත කඳ)	නව හන්දි ශාකය
F මහකඩොල් මුල (කයිරු මුල්)	කිරි අල

IV. a. උත්ස්වේදනය යන්න අර්ථ දක්වන්න (ලකුණු 2)

b. ඉහත රූප සටහන් වල දැක්වෙන ශාක අතරින් උත්ස්වේදනය වැඩිම ශාකය හා අඩුම ශාකය ලියන්න. (ලකුණු 2)

උත්ස්වේදනය වැඩිම ශාකය -

උත්ස්වේදනය අඩුම ශාකය -

4. ධාරාව පිළිබඳව මිනුම් කරන උපකරණ කිහිපයක් පහත දැක්වේ.



A B C D

I. ඉහත උපකරණ සම්මත සංකේත ඇසුරින් දක්වන්න? (ලකුණු 1/2 x 4 = 2)

II. ඉහත උපකරණ ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා අදාළ උපකරණය හෝ උපකරණ ලියා දක්වන්න?

a. ධාරාවේ දිශාව මැනීම

b. ධාරාවේ විශාලත්වය / ප්‍රමාණය මැණීම

c. විභව අන්තරය මැනීම

d. ඉතා කුඩා ධාරාවන් මැනීම

(ලකුණු 1/2 x 4 = 2)



III. රූපයේ X හා Y ස්ථාන වලට වඩාත් ගැළපෙන උපකරණය බැගින් ඉහත මිනුම් උපකරණ තුළින් තෝරා ලියන්න. (ලකුණු 2)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

IV. ඉහත ඔබ නම් කළ X හා Y එක් එක් උපකරණ පරිපථය හා සම්බන්ධ කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙක බැගින් ලියන්න (ලකුණු 4)

V. ඉහත X හා Y උපකරණ වල ධන හා සෘණ අග්‍ර වෙන්කර හඳුනා ගැනීමට භාවිත කර ඇති වර්ණ යුගලය ලියන්න. (ලකුණු 1)

5. A. නිවසේ දී බොහෝමයක් රසායනික ද්‍රව්‍ය විවිධ වැඩ කටයුතු කරගැනීමේ දී භාවිතයට ගනී. ඇතැම් ඒවා අවට පරිසරයෙන් සොයාගත හැකි ඒවාය.



I. ඉහත සඳහන් ද්‍රව්‍ය/ මිශ්‍රණ වලට ලිට්මස් දැමූ විට ඇතිවන නිරීක්ෂණ වලට ගැළපෙන අක්ෂරය / අක්ෂර ඉදිරියෙන් ලියා දක්වන්න?

රතු ලිට්මස් නිල් පැහැය	
නිල් ලිට්මස් රතු පැහැය	
නිල් ලිට්මස් නිල් පැහැය	
රතු ලිට්මස් රතු පැහැය	

(ලකුණු 1/2 x 10 = 5)

II. මී මැස්සෙකු දෂ්ඨ කළ විට හුණු ආලේප කළ පසු වේදනාව අඩු වන්නේ ඇයි? (ලකුණු 2)

III. විද්‍යාගාරයේ මේස කිහිපයක පහත පරිදි උපකරණ තබා ඇත.



ඉහත ක්‍රියාකාරකමේ භෞතික විපර්යාස පිළිබඳ අධ්‍යනය කළ හැකි කණ්ඩායම / කණ්ඩායම් කුමක්ද? (ලකුණු 2)

IV. R ක්‍රියාකාරකම සිදු කළ ආකාරය නම් කළ රූප සටහනක අදින්න? (ලකුණු 2)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

6. A පන්ති කාමරයේ ප්‍රදර්ශනයට ඉදි කරණ ලද තොරණක සර්වසම බල්බ හා කෝෂ සම්භන්ධ කොට ඇති ආකාරය පහත දැක්වේ.



I. ඉහත පරිපථය සංකේත සටහනකින් ඇඳ දක්වන්න (ලකුණු 1)

II. A,B,C බල්බ අතුරින් වැඩිම දීප්තියකින් දැල්වෙන්නේ කවර බල්බයද? (ලකුණු 1)

III. ඉහත පරිපථයේ බල්බ සියල්ලම උපරිම දීප්තියෙන් දල්වා ගැනීමට අවශ්‍යනම් ඒවා සම්බන්ධ කළ යුතු ආකාරය කෙසේද? (ලකුණු 1)

IV. මෙහි කෝෂ එකිනෙක සම්බන්ධ කොට ඇත්තේ කවර ආකාරයෙන්ද? (ලකුණු 1)

6. B රූපයෙන් දැක්වෙන්නේ යකඩ හැන්දක් මත තඹ ලෝහය ආලේපනයට සකස් කළ ඇටවුමකි.



I. මෙය ධාරාවේ කවර ඵලයක් නිරූපණය කරයිද? (ලකුණු 1)

II. ඇටවුම ක්‍රියාත්මක කිරීමේ දී දක්නට ලැබෙන නිරීක්ෂණ දෙකක් ලියා දක්වන්න (ලකුණු 2)

III. ඉහත ඇටවුමේ තඹ කම්බිය යටින් මාලිමාවක් තබා ස්විචය සංවෘත කළ විට නිරීක්ෂණය කුමක්ද? (ලකුණු 1)

IV. ඉහත iii හි නිරීක්ෂණ වලට හේතුව ධාරාවේ කවර ඵලයක්ද ? (ලකුණු 1)

V. ඔබේ නිවසේ විද්‍යුත් උවාරණ භාවිතයේ දී සැලකිළිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න? (ලකුණු 2)

7. A විවිධ පදාර්ථ විවිධ භෞතික ගුණ වලින් යුක්ත වේ. ද්‍රව්‍ය වෙන්කර හඳුනා ගැනීම සඳහා පදාර්ථ සතු භෞතික ගුණ ප්‍රමාණවත් වේ.



I. ඉහත ඇටවුම ඇසුරින් සිසුන් ආදර්ශනය කරන ලද්දේ පදාර්ථයේ කිනම් භෞතික ගුණයද? (ලකුණු 1)

II. ඇටවුම ඇසුරින් ලබාගන්නා නිරීක්ෂණය කුමක්ද? (ලකුණු 1)

III. A ලෝහ කුර ආරම්භයේ වූ පළමු ඉටි බෝලය පළමුව දිය වූවේ නම් ඔබ එළඹෙන නිගමනය කුමක්ද ? (ලකුණු 2)

IV. කාඩ්බෝඩ් කැබැල්ල භාවිතා කිරීමේ අරමුණු දෙකක් ලියන්න (ලකුණු 2)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

V. උණුසුම් කාලයේදී උළු වහළ වලට වඩා තහඩු සෙවෙලි කල වහළ යට සිටීම අපහසු වේ. පැහැදිලි කරන්න (ලකුණු 1)

7. B වායු කඳක් කම්පනයෙන් හඬ නිපදවන භාණ්ඩයක් ලෙස බටනළාව හඳුන්වා දිය හැකිය.



I. බටනලාවක කම්පන සංඛ්‍යාතය වැඩි කිරීමට කළ හැක්කේ කුමක් දැයි ඉහතරූප සටහන ඇසුරෙන් ලියන්න (ලකුණු 2)

II. ජීවයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා සංගීතය භාවිතා කළ හැකි ය. සංගීත චිකිත්සාව භාවිතයට ගන්නා අවස්ථා 2 ක් නම් කරන්න (ලකුණු 2)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com